# ශ්‍රී ලංකාවේ සංහිඳියාව පිළිබඳ මහජන මතය

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය - සෝෂල් ඉන්ඩිකේටර්

2024 මැයි

# අන්තර්ගතය


හැඳින්වීම ........................................ 4

ක්‍රමවේදය ........................................ 4

ප්‍රධාන සොයාගැනීම්හි සාරාංශය ........................................ 4

ප්‍රධාන සොයාගැනීම් ........................................ 5

ආර්ථික කටයුතු සඳහා අවස්ථාවන් ........................................ 5

ප්‍රස්තාරය 01:වසර 15කට පෙර හා සසඳන විට ඔබේ ප්‍රදේශයේ ජනතාවට තිබෙන ආර්ථික අවස්ථා ඔබ තක්සේරු කරන්නේ කෙසේද - ජාතික සහ ජනවාර්ගික ........................................ 5

ප්‍රස්ථාරය 02:වසර 15කට පෙර හා සසඳන විට ඔබේ ප්‍රදේශයේ ජනතාවට තිබෙන ආර්ථික අවස්ථා ඔබ තක්සේරු කරන්නේ කෙසේද - වයස, ප්‍රදේශය සහ ස්ත්‍රී පුරුෂභාවය ........................................ 6

ප්‍රස්තාරය 03:අනෙකුත් වාර්ගික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ වාර්ගික ප්‍රජාවට, ඔබේ ප්‍රදේශයේ පවතින ආර්ථික අවස්ථා සඳහා ප්‍රවේශය ඔබ තක්සේරු කරන්නේ කෙසේ ද? - ජාතික........................................ 6

ප්‍රස්තාරය 04:අනෙකුත් වාර්ගික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ වාර්ගික ප්‍රජාවට, ඔබේ ප්‍රදේශයේ පවතින ආර්ථික අවස්ථා සඳහා ප්‍රවේශය ඔබ තක්සේරු කරන්නේ කෙසේ ද? - ජනවාර්ගික ........................................ 7

ප්‍රස්තාරය 05:අනෙකුත් ආගමික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ආගමික ප්‍රජාවට,ඔබේ ප්‍රදේශයේ පවතින ආර්ථික අවස්ථා සඳහා ප්‍රවේශය ඔබ තක්සේරු කරන්නේ කෙසේ ද? - ජාතික........................................ 7

වගුව 01:අනෙකුත් ආගමික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ආගමික ප්‍රජාවට, ඔබේ ප්‍රදේශයේ පවතින ආර්ථික අවස්ථා සඳහා ප්‍රවේශය ඔබ තක්සේරු කරන්නේ කෙසේ ද? - ආගම........................................ 8

අධ්‍යාපනය සඳහා ඇති අවස්ථා........................................ 8

ප්‍රස්තාරය 06:වසර 15කට පෙර හා සසඳන විට ඔබේ ප්‍රදේශයෙ ජනතාවට තිබෙන අධ්‍යාපනික අවස්ථා ඔබ තක්සේරු කරන්නේ කෙසේද - ජාතික සහ ජනවාර්ගික ........................................ 8

ප්‍රස්තාරය 07:වසර 15කට පෙර හා සසඳන විට ඔබේ ප්‍රදේශයෙ ජනතාවට තිබෙන අධ්‍යාපනික අවස්ථා ඔබ තක්සේරු කරන්නේ කෙසේද - වයස, ප්‍රදේශය සහ ස්ත්‍රී පුරුෂභාවය ........................................ 9

ප්‍රස්තාරය 08:ඔබේ වාර්ගික ප්‍රජාවට, අනෙකුත් වාර්ගික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ප්‍රදේශයේ පවතින අධ්‍යාපනික අවස්ථා සඳහා ප්‍රවේශය ඔබ තක්සේරු කරන්නේ කෙසේ ද? - ජාතික ........................................ 9

ප්‍රස්තාරය 09:ඔබේ වාර්ගික ප්‍රජාවට, අනෙකුත් වාර්ගික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ප්‍රදේශයේ පවතින අධ්‍යාපනික අවස්ථා සඳහා ප්‍රවේශය ඔබ තක්සේරු කරන්නේ කෙසේ ද? - ජනවාර්ගික ........................................ 10

ප්‍රස්තාරය 10:ඔබේ ආගමික ප්‍රජාවට, අනෙකුත් ආගමික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ප්‍රදේශයේ පවතින අධ්‍යාපනික අවස්ථා සඳහා ප්‍රවේශය ඔබ තක්සේරු කරන්නේ කෙසේ ද? - ජාතික ........................................ 10

වගුව 02:ඔබේ ආගමික ප්‍රජාවට, අනෙකුත් ආගමික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ප්‍රදේශයේ පවතින අධ්‍යාපනික අවස්ථා සඳහා ප්‍රවේශය ඔබ තක්සේරු කරන්නේ කෙසේ ද? - ආගම........................................ 11

## ආරක්ෂිත බව පිළිබඳ හැඟීම ........ 11


ප්‍රස්තාරය 11:එදිනෙදා කටයුතුවලට, ආගමික කටයුතුවලට සහ ආර්ථික කටයුතුවලට සහභාගී වීම පිළිබඳ ආරක්ෂිත බවක් දැනීම - ජාතික ........ 11

වගුව 03:එදිනෙදා කටයුතුවලට සහභාගී වීම පිළිබඳ ආරක්ෂිත බවක් දැනීම - ජනවාර්ගික ........ 11

වගුව 04:ආගමික කටයුතුවලට සහභාගී වීම පිළිබඳ ආරක්ෂිත බවක් දැනීම - ආගම ........ 12

වගුව 05:ආර්ථික කටයුතුවලට සහභාගී වීම පිළිබඳ ආරක්ෂිත බවක් දැනීම - ජනවාර්ගික ........ 12


## දේශපාලන අන්තර් සබඳතා ........ 12


ප්‍රස්තාරය 12:ශ්‍රී ලංකාවේ සියලු ජනවාර්ගික කණ්ඩායම්වලට සාමකාමීව ජීවත් වීමට කොතරම්දුරට හැකි දැයි ඔබ සිතන්නේද? - ජාතික ........ 12

ප්‍රස්තාරය 13:ශ්‍රී ලංකාවේ සියලු ජනවාර්ගික කණ්ඩායම්වලට සාමකාමීව ජීවත් වීමට කොතරම්දුරට හැකි දැයි ඔබ සිතන්නේද? - ජනවාර්ගික ........ 13

ප්‍රස්තාරය 14:ශ්‍රී ලංකාවේ සියලු ජනවාර්ගික කණ්ඩායම්වලට සාමකාමීව ජීවත් වීමට කොතරම්දුරට හැකි දැයි ඔබ සිතන්නේද? - වයස, ප්‍රදේශය සහ ස්ත්‍රී පුරුෂභාවය ........ 13

ප්‍රස්තාරය 15:ශ්‍රී ලංකාවේ සියලු ආගමික කණ්ඩායම්වලට සාමකාමීව ජීවත් වීමට කොතරම්දුරට හැකි දැයි ඔබ සිතන්නේද? - ජාතික ........ 14

වගුව 06:ශ්‍රී ලංකාවේ සියලු ආගමික කණ්ඩායම්වලට සාමකාමීව ජීවත් වීමට කොතරම්දුරට හැකි දැයි ඔබ සිතන්නේද? - වයස, ප්‍රදේශය සහ ස්ත්‍රී පුරුෂභාවය ........ 14

ප්‍රස්තාරය 16:ශ්‍රී ලංකාවේ සියලු ආගමික කණ්ඩායම්වලට සාමකාමීව ජීවත් වීමට කොතරම්දුරට හැකි දැයි ඔබ සිතන්නේද? - ආගම ........ 15


## දේශපාලන නායකත්වය පිළිබඳ අදහස ........ 15


ප්‍රස්තාරය 17:සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා සාමකාමී ජීවිතයක් ළඟාකර දීමට අපගේ ජාතික මට්ටමේ දේශපාලන නායකයින් කොතරම්දුරට අවංකවම කටයුතු කරනවාදැයි ඔබ සිතනවාද? - ජාතික ........ 15

ප්‍රස්තාරය 18:සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා සාමකාමී ජීවිතයක් ළඟාකර දීමට අපගේ ජාතික මට්ටමේ දේශපාලන නායකයින් කොතරම්දුරට අවංකවම කටයුතු කරනවාදැයි ඔබ සිතනවාද? - ජනවාර්ගික ........ 16

ප්‍රස්තාරය 19:සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා සාමකාමී ජීවිතයක් ළඟාකර දීමට අපගේ ජාතික මට්ටමේ දේශපාලන නායකයින් කොතරම්දුරට අවංකවම කටයුතු කරනවාදැයි ඔබ සිතනවාද? - වයස, ප්‍රදේශය සහ ස්ත්‍රී පුරුෂභාවය ........ 16


## ආගමික නායකත්වය පිළිබඳ අදහස ........ 17


ප්‍රස්තාරය 20:සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා සාමකාමී ජීවිතයක් ළඟාකර දීමට අපගේ ජාතික මට්ටමේ ආගමික නායකයින් කොතරම්දුරට අවංකවම කටයුතු කරනවාදැයි ඔබ සිතනවාද? - ජාතික ........ 17

වගුව 07:සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා සාමකාමී ජීවිතයක් ළඟාකර දීමට අපගේ ජාතික මට්ටමේ ආගමික නායකයින් කොතරම්දුරට අවංකවම කටයුතු කරනවාදැයි ඔබ සිතනවාද? - ආගම ........ 17

ප්‍රස්තාරය 21:සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා සාමකාමී ජීවිතයක් ළඟාකර දීමට අපගේ ජාතික මට්ටමේ ආගමික නායකයින් කොතරම්දුරට අවංකවම කටයුතු කරනවාදැයි ඔබ සිතනවාද? - වයස, ප්‍රදේශය සහ ස්ත්‍රී පුරුෂභාවය ........ 18

## හැඳින්වීම

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ පර්යේෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් විසින් පවත්වන ලද සංහිඳියාව පිළිබඳ සමීක්ෂණයේ ප්‍රධාන සොයාගැනීම් මෙම වාර්තාවෙන් ඉදිරිපත් කරයි. මෙම මත විමසුම සැලසුම් කරන ලද්දේ, ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සහ සංහිඳියාව යන තේමාවන්ට අදාළ කරුණු සම්බන්ධයෙන් වත්මන් මහජන මතය ග්‍රහණය කර ගැනීම සඳහාය. මෙම සංක්ෂිප්ත වාර්තාව තුළින් ආර්ථික සහ අධ්‍යාපනික වර්ධනයන්ගේ අපේක්ෂාවන්, ආරක්ෂාව, දේශපාලන අන්තර්ක්‍රියා මෙන්ම දේශපාලනික සහ ආගමික නායකයන් පිළිබඳ දැක්ම යනාදිය පිළිබඳව සාකච්ඡා කරයි.

2024 වසර වන විට ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය අවසන් වී වසර 15ක කාලයක් ගත වී තිබේ. 2009 වසරේ යුද්ධය අවසන් වීමේ සිට බලයට පත් වූ රජයන් ප්‍රකාශ කර සිටින්නේ, යුද්ධයෙන් පීඩාවට පත් වන ප්‍රජාවන් අතර සංහිඳියාව ඇති කිරීමට තමන් කටයුතු කරමින් සිටින බවයි. රාජ්‍ය ප්‍රයත්නයන්ට අමතරව, සිවිල් සමාජය ද සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමට සහ රටට ස්ථිර සාමයක් ඇති කිරීමට බොහෝ මුල පිරීම්වල නිරත වේ. මෙම සංදර්භය තුළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ - සෝෂල් ඉන්ඩිකේටර් විසින් මෙම මත විමසුමට අවතීර්ණ වූයේ, වාර්ගික ගැටුම හේතුවෙන් වසර 30කට වැඩි කාලයක් පීඩාවට පත් වූ ප්‍රජාවන් අතර සංහිඳියාව ඇති කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා රට කෙතරම්දුරට ප්‍රගතියක් ලබා තිබේ ද යන්න විමසා බැලීමට ය. සංහිඳියාව තවමත් නිම නොකළ කාර්යයක්ව පවතිද්දීත්, කල්පවත්නා වූ සාමයක් සහ සංහිඳියාවක් සාක්ෂාත් කර ගැනීමේ වැදගත්කම විශ්වාස කරන ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ සහ විවිධ පාර්ශ්වකරුවන්ගේ අවංක උත්සාහයට ද මෙම සමීක්ෂණය මඟින් මඟ පාදයි.

## ක්‍රමවේදය

මෙම සමීක්ෂණය සඳහා දිස්ත්‍රික්ක 25න්ම ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් හතරට (සිංහල, දෙමළ, මලෙයහ දෙමළ සහ මුස්ලිම්) අයත් පුද්ගලයන් 1372ක් සහභාගි කරගන්නා ලදී. බහු-අදියර අහඹු ස්ථරීයකරණය නියැදි තාක්ෂණය භාවිතා කරමින් තෝරාගත් ප්‍රතිචාරකයින් අතර අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතයෙන් මෙම සමීක්ෂණය සිදු කරන ලදී. ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් හතරට අයත් ක්ෂේත්‍ර සමීක්ෂකයන් 74ක් (ස්ත්‍රීන් සහ පුරුෂයන්) සහභාගී කර ගනිමින් ක්ෂේත්‍ර කටයුතු 2024 පෙබරවාරි 19 වන දින සිට මාර්තු 13 වන දින දක්වා පවත්වන ලදී. දත්ත රැස් කිරීමේ ක්‍රියාවලිය අවසන් වූ පසුව, ජනවාර්ගික සහ දිස්ත්‍රික්කයේ සැබෑ ජනගහන අනුපාතය පිළිබිඹු කිරීම සඳහා දත්ත කට්ටලය බර තබා ඇත. සමාජීය විද්‍යාවන් සඳහා වන සංඛ්‍යාන පැකේජය (SPSS) භාවිතයෙන් දත්ත විශ්ලේෂණය කරන ලදී.


## ප්‍රධාන සොයාගැනීම්හි සාරාංශය

සියලුම ජනවාර්ගික කණ්ඩායම්වලට අයත් ශ්‍රී ලාංකිකයන්ගෙන් අතිමහත් බහුතරයක් ප්‍රකාශ කරන්නේ එදිනෙදා කටයුතු, ආගමික කටයුතු සහ ආර්ථික කටයුතු යනාදියෙහි නිරතවීමේදී ඔවුන්ට ආරක්ෂිත බවක් දැනෙන බවයි. එමෙන්ම, ශ්‍රී ලංකාවේ සියලුම ජනවර්ගවලට සාමකාමීව ජීවත් විය හැකිය යන අදහසට සියලු ජනවර්ගයන් වර්තමානය වන විට එකඟ වන බව දක්නට හැකිය. මෙය විශේෂයෙන්ම තරුණ වියේදී යුද්ධයෙහි අත්දැකීම් සහිත ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර දක්නට ලැබේ. සංහිඳියාව පිළිබඳ ශුභවාදී අදහස් පැවැතිය ද, සමීක්ෂණය පෙන්වා දෙන්නේ වාර්ගික ප්‍රජාවන් තමන්ට ආර්ථික අවස්ථා සඳහා අසමාන ප්‍රවේශයක් ඇතැයි විශ්වාස කරන බවයි. ජනතාව රටේ ද්‍රව්‍යමය භෞතික දියුණුව පිළිබඳ ධනාත්මක තක්සේරුවක් ප්‍රකාශ කරන අතර, ඔවුන් තමන්ගේ ජාතික දේශපාලන නායකත්වය කෙරෙහි දැඩි අවිශ්වාසයක් සහ ජාතික සංස්කෘතික නායකත්වය - ආගමික නායකත්වය කෙරෙහි යම් ප්‍රමාණයකට අවිශ්වාසයක් ප්‍රකාශ කරයි.


## ආර්ථික කටයුතු සඳහා අවස්ථාවන්

සාමාන්‍ය අවබෝධයට ප්‍රතිවිරුද්ධව, ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට ආසන්න පිරිසකට හැඟෙන්නේ වසර 15කට පෙර පැවති ආර්ථික අවස්ථා හා සසඳන විට ආර්ථික අවස්ථාවන් අඩු වී ඇති බවයි. යුද්ධය අවසන් වීමේ සිට සියලු යටිතල පහසුකම් සංවර්ධනය සහ සංචරණ අවස්ථා වැඩිවීමක් වුවද, ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට වඩා වැඩි පිරිසක් ආර්ථික අවස්ථාවන්හි දියුණුව පිළි නොගැනීම මෙහි විශේෂ කරුණකි. මෙම මතය අනෙක් ජනවාර්ගික ප්‍රජාවන්ට වඩා දෙමළ ප්‍රජාව අතර පැවැතීම මෙම ව්‍යාකූලත්වය තවත් තීව්‍ර කරයි. දෙමළ ප්‍රජාවෙන් 56% ට ආසන්න ප්‍රමාණයක් සහ සිංහල ප්‍රජාවෙන් 49%ක් ද මුස්ලිම් ප්‍රජාවෙන් 47% ක් ද ප්‍රකාශ කරන්නේ වසර 15කට පෙර තමන්ට පැවැති ආර්ථික අවස්ථාවන්ට වඩා අඩු ආර්ථික අවස්ථා ඔවුන් දැන් අත්විඳින බවයි. ප්‍රස්ථාර අංක 2 හි දැක්වෙන පරිදි, වසර 15කට පෙර හා සසඳන විට දැන් පවතින තත්වය තුළ අඩු ආර්ථික අවස්ථා මිනිසුන් අත්විඳින ලද බවට වන මතය කෙරෙහි යෞවනයෙකු ලෙස යුද්ධයේ අත්දැකීම් ඇති අය (දැනට වයස අවුරුදු 31-45) සහ පරිණත පුද්ගලයෙකු ලෙස යුද්ධයේ අත්දැකීම් ඇති අය (දැනට වයස අවුරුදු 46 ට වැඩි) අතර ඉහළ මට්ටමක විශ්වාසයක් පවතී. එසේම, දැනට පවතින්නේ අඩු අවස්ථාවක් බවට වන මතය ග්‍රාමීය සහ ස්ත්‍රී කණ්ඩායම් හා සැසඳීමේදී බොහෝ නාගරික ශ්‍රී ලාංකිකයන් සහ පුරුෂයන් අතර වැඩි වශයෙන් දක්නට හැකිය. (ප්‍රස්ථාර අංක 01 සහ 02 බලන්න)

**ප්‍රස්තාරය 01:** වසර 15කට පෙර හා සසඳන විට ඔබේ ප්‍රදේශයේ ජනතාවට තිබෙන ආර්ථික අවස්ථා ඔබ තක්සේරු කරන්නේ කෙසේද - ජාතික සහ ජනවාර්ගික




**ප්‍රස්තාරය 02:** වසර 15කට පෙර හා සසඳන විට ඔබේ ප්‍රදේශයේ ජනතාවට තිබෙන ආර්ථික අවස්ථා ඔබ තක්සේරු කරන්නේ කෙසේද - වයස, ප්‍රදේශය සහ ස්ත්‍රී පුරුෂභාවය





පුද්ගල අත්දැකීම් විමසීමත් සමඟ, අනෙකුත් ප්‍රජාවන්ට සාපේක්ෂව තම ජනවාර්ගික ප්‍රජාවට ආර්ථික අවස්ථා සඳහා පවත්නා ප්‍රවේශය පිළිබඳ ජනතාව සිතන්නේ කෙසේද යන්න විමසා බැලීම සමීක්ෂණයේදී සිදු විය. දෙමළ සහ මලෙයහ දෙමළ ප්‍රජාවන් පැහැදිලිව පෙන්වා දෙන්නේ ඔවුන්ට ආර්ථික අවස්ථා සඳහා සාපේක්ෂව අඩු ප්‍රවේශයක් පවතින බවයි. සිංහල සහ මුස්ලිම් ප්‍රජාවන්ගෙන් බහුතරයට හැඟෙන්නේ තම ප්‍රජාවට අනෙකුත් ජනවාර්ගික කණ්ඩායම්වලට වඩා ආර්ථික අවස්ථා සඳහා වැඩි හෝ සමාන ප්‍රවේශයක් පවතින බවයි. (ප්‍රස්තාර 03 සහ 04 බලන්න)

**ප්‍රස්තාරය 03:** අනෙකුත් වාර්ගික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ වාර්ගික ප්‍රජාවට, ඔබේ ප්‍රදේශයේ පවතින ආර්ථික අවස්ථා සඳහා ප්‍රවේශය ඔබ තක්සේරු කරන්නේ කෙසේ ද? - ජාතික




ප්‍රස්තාරය 04: අනෙකුත් වාර්ගික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ වාර්ගික ප්‍රජාවට, ඔබේ ප්‍රදේශයේ පවතින ආර්ථික අවස්ථා සඳහා ප්‍රවේශය ඔබ තක්සේරු කරන්නේ කෙසේ ද?
- ජනවාර්ගික




## ආර්ථික අවස්ථා සඳහා ප්‍රවේශය

අනෙකුත් ආගමික ප්‍රජාවන්ට සාපේක්ෂව තම ආගමික ප්‍රජාවට ආර්ථික අවස්ථා සඳහා ප්‍රවේශය කෙරෙහි ජනතාව සිතන්නේ කෙසේද යන්න පිළිබඳව ද මෙම සමීක්ෂණයෙන් විමසන ලදී. අනෙකුත් ආගමික කණ්ඩායම්වලට වඩා තම ආගමික ප්‍රජාවන්ට ආර්ථික අවස්ථා සඳහා වැඩි හෝ සමාන ප්‍රවේශයක් ඇතැයි බෞද්ධයන් සිතන අතර, සුළුතර ආගමික ප්‍රජාවන් අනෙක් ආගමික ප්‍රජාවන්ට සාපේක්ෂව ආර්ථික අවස්ථා සඳහා අඩු ප්‍රවේශයක් ඇති බව සඳහන් කරන බව පෙනේ. (ප්‍රස්තාර අංක 05 සහ වගු අංක 01 බලන්න)

ප්‍රස්තාරය 05: අනෙකුත් ආගමික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ආගමික ප්‍රජාවට, ඔබේ ප්‍රදේශයේ පවතින ආර්ථික අවස්ථා සඳහා ප්‍රවේශය ඔබ තක්සේරු කරන්නේ කෙසේ ද?
- ජාතික



වගුව 01: අනෙකුත් ආගමික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ආගමික ප්‍රජාවට, ඔබේ ප්‍රදේශයේ පවතින ආර්ථික අවස්ථා සඳහා ප්‍රවේශය ඔබ තක්සේරු කරන්නේ කෙසේ ද? -ආගම


| | බුද්ධාගම | හින්දු | ඉස්ලාම් | රෝමානු කතෝලික | රෝමානු කතෝලික නොවන |
|---|---|---|---|---|---|
| වැඩි ප්‍රවේශයක් ඇත | 31.6% | 8.6% | 14.2% | 35.7% | 36.4% |
| සමාන ප්‍රවේශයක් ඇත | 38.7% | 33.3% | 46.5% | 38.1% | 18.2% |
| අඩු ප්‍රවේශයක් ඇත | 25.3% | 54.3% | 33.9% | 26.2% | 45.5% |
| නොදනී | 4.4% | 3.8% | 5.5% | 0.0% | 0.0% |
| ප්‍රතිචාරකයින් සංඛ්‍යාව | 1004 | 186 | 127 | 42 | 11* |

* ප්‍රතිචාරකයින් සංඛ්‍යාව ඉතා කුඩා ප්‍රමාණයකි.


## අධ්‍යාපනය සඳහා ඇති අවස්ථා

සමීක්ෂණ සොයාගැනීම්වලින් පෙනී යන්නේ යුද්ධයේ අවසානය වන විට, සියලු ජනවාර්ගික කණ්ඩායම්වලට අධ්‍යාපනික අවස්ථා සඳහා ප්‍රවේශය පැහැදිලිවම වැඩිදියුණු වී ඇති බවයි. මෙම මතය ස්ත්‍රීන් සහ පුරුෂයන්, විවිධ ප්‍රදේශවල සහ විවිධ වයස් කාණ්ඩවල සිටින අය අතර දක්නට ලැබේ. (ප්‍රස්තාර අංක 06 සහ 07 බලන්න)

**ප්‍රස්තාරය 06:** වසර 15කට පෙර හා සසඳන විට ඔබේ ප්‍රදේශයේ ජනතාවට තිබෙන අධ්‍යාපනික අවස්ථා ඔබ තක්සේරු කරන්නේ කෙසේද - ජාතික සහ ජනවාර්ගික




**ප්‍රස්තාරය 07:** වසර 15කට පෙර හා සසඳන විට ඔබේ ප්‍රදේශයේ ජනතාවට තිබෙන අධ්‍යාපනික අවස්ථා ඔබ තක්සේරු කරන්නේ කෙසේද - වයස, ප්‍රදේශය සහ ස්ත්‍රී පුරුෂභාවය





අනෙකුත් ජනවාර්ගික ප්‍රජාවන්ට සාපේක්ෂව තමන්ගේම ජනවාර්ගික ප්‍රජාවට අධ්‍යාපනය සඳහා ඇති ප්‍රවේශය තක්සේරුවට ලක් කරන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටින විට, මලෙයාහ දෙමළ ප්‍රජාව හැර සිංහල, දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන්ගෙන් අති බහුතරයක් තම ප්‍රජාවන් අනෙක් ප්‍රජාවන්ට සාපේක්ෂව වැඩි හෝ සමාන ප්‍රවේශයක් භුක්ති විඳින බව දක්වයි. (ප්‍රස්තාර අංක 08 සහ 9 බලන්න)

**ප්‍රස්තාරය 08:** ඔබේ වාර්ගික ප්‍රජාවට, අනෙකුත් වාර්ගික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ප්‍රදේශයේ පවතින අධ්‍යාපනික අවස්ථා සඳහා ප්‍රවේශය ඔබ තක්සේරු කරන්නේ කෙසේ ද? - ජාතික




ප්‍රස්තාරය 09: ඔබේ වාර්ගික ප්‍රජාවට, අනෙකුත් වාර්ගික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ප්‍රදේශයේ පවතින අධ්‍යාපනික අවස්ථා සඳහා ප්‍රවේශය ඔබ තක්සේරු කරන්නේ කෙසේ ද?
-ජනවාර්ගික




අනෙකුත් ආගමික ප්‍රජාවන්ට සාපේක්ෂව තම ආගමික ප්‍රජාවට අධ්‍යාපනයට ඇති ප්‍රවේශය තක්සේරු කරන ලෙස ප්‍රතිචාරකයින්ගෙන් ඉල්ලා සිටින විට, බෞද්ධ, හින්දු සහ මුස්ලිම් අති බහුතරයක් තම ප්‍රජාවන් අනෙකුත් ආගමික ප්‍රජාවන්ට සාපේක්ෂව වැඩි හෝ සමාන ප්‍රවේශයක් භුක්ති විඳින බව දක්වයි. (ප්‍රස්තාර 10 සහ වගුව අංක 02 බලන්න)

ප්‍රස්තාරය 10: ඔබේ ආගමික ප්‍රජාවට, අනෙකුත් ආගමික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ප්‍රදේශයේ පවතින අධ්‍යාපනික අවස්ථා සඳහා ප්‍රවේශය ඔබ තක්සේරු කරන්නේ කෙසේ ද?
- ජාතික



වගුව 02: ඔබේ ආගමික ප්‍රජාවට, අනෙකුත් ආගමික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ප්‍රදේශයේ පවතින අධ්‍යාපනික අවස්ථා සඳහා ප්‍රවේශය ඔබ තක්සේරු කරන්නේ කෙසේ ද? - ආගම


| | බුද්ධාගම | හින්දු | ඉස්ලාම් | රෝමානු කතෝලික | රෝමානු කතෝලික නොවන |
|---|---|---|---|---|---|
| වැඩි ප්‍රවේශයක් ඇත | 37.5% | 37.6% | 35.2% | 37.2% | 40.0% |
| සමාන ප්‍රවේශයක් ඇත | 44.0% | 40.3% | 49.2% | 37.2% | 60.0% |
| අඩු ප්‍රවේශයක් ඇත | 12.5% | 18.3% | 13.3% | 25.6% | 0.0% |
| නොදනී | 6.0% | 3.8% | 2.3% | 0.0% | 0.0% |
| ප්‍රතිචාරකයින් සංඛ්‍යාව | 1004 | 186 | 128 | 43 | 10* |

* ප්‍රතිචාරකයින් සංඛ්‍යාව ඉතා කුඩා ප්‍රමාණයකි.

## ආරක්ෂිත බව පිළිබඳ හැඟීම

ජනතාව තමන්ගේ එදිනෙදා කටයුතුවලට, ආගමික කටයුතුවලට සහ ආර්ථික කටයුතුවලට සහභාගී වීම පිළිබඳ ආරක්ෂිත බවක් දැනෙන බව ප්‍රකාශ කරයි. සියලු ජනවාර්ගික කණ්ඩායම්වලට අයත් අති බහුතරයක් විසින් මෙම ක්‍රියාකාරකම්වල නියැලීමට තමන්ට ආරක්ෂිත බවක් දැනෙන බව ප්‍රකාශ කිරීමෙන් මෙය පිළිබිඹු වේ. (ප්‍රස්තාර 11 සහ වගුව අංක 03, 04, 05 බලන්න)

ප්‍රස්තාරය 11: එදිනෙදා කටයුතුවලට, ආගමික කටයුතුවලට සහ ආර්ථික කටයුතුවලට සහභාගී වීම පිළිබඳ ආරක්ෂිත බවක් දැනීම - ජාතික




වගුව 03: එදිනෙදා කටයුතුවලට සහභාගී වීම පිළිබඳ ආරක්ෂිත බවක් දැනීම - ජනවාර්ගික

| | සිංහල | දෙමළ | මලෙයෙහ දෙමළ | මුස්ලිම් |
|---|---|---|---|---|
| ආරක්ෂිතයි | 89.0% | 89.0% | 91.2% | 91.3% |
| අනාරක්ෂිතයි | 10.9% | 9.1% | 7.0% | 7.1% |
| නොදනී | 0.2% | 1.9% | 1.8% | 1.6% |
| ප්‍රතිචාරකයින් සංඛ්‍යාව | 1032 | 154 | 57 | 127 |

වගුව 04: ආගමික කටයුතුවලට සහභාගී වීම පිළිබඳ ආරක්ෂිත බවක් දැනීම - ආගම

| | බුද්ධාගම | හින්දු | ඉස්ලාම් | රෝමානු කතෝලික | රෝමානු කතෝලික නොවන |
|---|---|---|---|---|---|
| ආරක්ෂිතයි | 92.8% | 91.4% | 94.5% | 92.9% | 80.0% |
| අනාරක්ෂිතයි | 6.6% | 6.5% | 3.9% | 7.1% | 20.0% |
| නොදනී | 0.6% | 2.2% | 1.6% | 0.0% | 0.0% |
| ප්‍රතිචාරකයින් සංඛ්‍යාව | 1003 | 186 | 128 | 42 | 10* |

*ප්‍රතිචාරකයින් සංඛ්‍යාව ඉතා කුඩා ප්‍රමාණයකි

වගුව 05: ආර්ථික කටයුතුවලට සහභාගී වීම පිළිබඳ ආරක්ෂිත බවක් දැනීම - ජනවාර්ගික


| | සිංහල | දෙමළ | මලෙයගහ දෙමළ | මුස්ලිම් |
|---|---|---|---|---|
| ආරක්ෂිතයි | 83.6% | 79.1% | 80.7% | 88.3% |
| අනාරක්ෂිතයි | 12.7% | 15.7% | 15.8% | 7.0% |
| නොදනී | 3.7% | 5.2% | 3.5% | 4.7% |
| ප්‍රතිචාරකයින් සංඛ්‍යාව | 1032 | 153 | 57 | 128 |

## දේශපාලන අන්තර් සබඳතා


ශ්‍රී ලාංකිකයන්ගෙන් අතිමහත් බහුතරයක් සිතන්නේ සියලුම ජනවර්ග (89.7%) සහ ආගමික කණ්ඩායම්වලට (89.6%) ශ්‍රී ලංකාව තුළ සාමකාමීව ජීවත් විය හැකි බවයි. මෙම දෘෂ්ටිකෝණය සියලුම ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් අතර දක්නට ලැබේ. (ප්‍රස්තාර 12 බලන්න) සියලුම වාර්ගික කණ්ඩායම්වලින් අතිමහත් බහුතරයක් ප්‍රකාශ කරන්නේ බොහෝ දුරට හෝ තරමක්දුරට ශ්‍රී ලංකාවේ සියලු ජනවර්ගවලට සාමකාමීව ජීවත් විය හැකි බවයි.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ සියලු ජනවාර්ගික ප්‍රජාවන්ට කිසිසේත්ම සාමකාමීව ජීවත් විය නොහැකි බව හැඟී ගිය දෙමළ ජාතිකයන්ගෙන් 14% ක් සහ මලෙයගහ දෙමළ ප්‍රජාවෙන් 12% ක් සිටින බව සැලකිල්ලට ගත යුතුය. තරුණ වියේදී යුද්ධයේ අත්දැකීම් ඇති ශ්‍රී ලාංකිකයන්, යුද්ධය අවසන් වී වසර 15කට පසුව ඔවුන්ගේ වැඩිහිටි සහ තරුණ කණ්ඩායම් හා සසඳන විට, ශ්‍රී ලංකාවේ සියලුම ජනවර්ගවලට සාමකාමීව ජීවත් විය හැකි බව බොහෝ දුරට විශ්වාස කරති. (ප්‍රස්තාර 12, 13, 14 බලන්න)


ප්‍රස්තාරය 12: ශ්‍රී ලංකාවේ සියලු ජනවාර්ගික කණ්ඩායම්වලට සාමකාමීව ජීවත් වීමට කොතරම්දුරට හැකි දැයි ඔබ සිතන්නේද? - ජාතික



ප්‍රස්තාරය 13: ශ්‍රී ලංකාවේ සියලු ජනවාර්ගික කණ්ඩායම්වලට සාමකාමීව ජීවත් වීමට කොතරම් දුරට හැකි දැයි ඔබ සිතන්නේද? - ජනවාර්ගික





ප්‍රස්තාරය 14: ශ්‍රී ලංකාවේ සියලු ජනවාර්ගික කණ්ඩායම්වලට සාමකාමීව ජීවත් වීමට කොතරම්දුරට හැකි දැයි ඔබ සිතන්නේද? - වයස, ප්‍රදේශය සහ ස්ත්‍රී පුරුෂභාවය



සියලුම ආගමික කණ්ඩායම්වලින් අති බහුතරයක් ප්‍රකාශ කරන්නේ බොහෝ දුරට හෝ තරමක් දුරට ශ්‍රී ලංකාව තුළ සාමකාමීව ජීවත් විය හැකි බවයි. හින්දු ප්‍රජාවෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් ද ඒ හා සමාන අදහස් ප්‍රකාශ කළහ. තරුණ වියේදී යුද්ධයේ අත්දැකීම් ඇති ශ්‍රී ලාංකිකයන්, යුද්ධය අවසන් වී වසර 15කට පසුව ඔවුන්ගේ වැඩිහිටි සහ තරුණ කණ්ඩායම් හා සසඳන විට, ශ්‍රී ලංකාවේ සියලුම ආගමික කණ්ඩායම්වලට සාමකාමීව ජීවත් විය හැකි බව බොහෝ දුරට විශ්වාස කරති. (ප්‍රස්තාර 15 සහ 16, වගු අංක 06 බලන්න)

**ප්‍රස්තාරය 15:** ශ්‍රී ලංකාවේ සියලු ආගමික කණ්ඩායම්වලට සාමකාමීව ජීවත් වීමට කොතරම්දුරට හැකි දැයි ඔබ සිතන්නේද? - ජාතික





වගුව 06: ශ්‍රී ලංකාවේ සියලු ආගමික කණ්ඩායම්වලට සාමකාමීව ජීවත් වීමට කොතරම්දුරට හැකි දැයි ඔබ සිතන්නේද?- ආගම

| | බුද්ධාගම | හින්දු | ඉස්ලාම් | රෝමානු කතෝලික | රෝමානු කතෝලික නොවන |
|---|---|---|---|---|---|
| බොහෝදුරට | 50.3% | 24.7% | 46.9% | 9.3% | 36.4% |
| තරමක් දුරට | 41.1% | 53.8% | 46.9% | 76.7% | 36.4% |
| කිසිසේත්ම නැත | 7.1% | 15.6% | 3.1% | 9.3% | 27.3% |
| නොදනී | 1.5% | 5.9% | 3.1% | 4.7% | 0.0% |
| ප්‍රතිචාරකයින් සංඛ්‍යාව | 1003 | 186 | 128 | 43 | 11* |

*ප්‍රතිචාරකයින් සංඛ්‍යාව ඉතා කුඩා ප්‍රමාණයකි


ප්‍රස්තාරය 16: ශ්‍රී ලංකාවේ සියලු ආගමික කණ්ඩායම්වලට සාමකාමීව ජීවත් වීමට කොතරම්දුරට හැකි දැයි ඔබ සිතන්නේද? - වයස, ප්‍රදේශය සහ ස්ත්‍රී පුරුෂභාවය





## දේශපාලන නායකත්වය පිළිබඳ අදහස

දේශපාලන නායකත්වයේ ක්‍රියාකාරීත්වය සහ ශ්‍රී ලංකාව තුළ සාමය ඇති කිරීම සඳහා ඔවුන් දක්වන කැපවීම පිළිබඳ මහජන මතය තක්සේරු කිරීමට ද මෙම සමීක්ෂණයෙන් උත්සාහ කර ඇත. මෙම සොයාගැනීම්වලින් පෙනී යන්නේ සාමය සඳහා ජාතික මට්ටමේ දේශපාලන නායකත්වයේ කැපවීම පිළිබඳව සියලු ජනවාර්ගික ප්‍රජාවන් අතර, විශේෂයෙන් සිංහල ප්‍රජාව අතර දැඩි සැකයක් පවතින බවයි. ශ්‍රී ලාංකිකයන්ගෙන් 70% ක් පමණ සිතන්නේ ඔවුන්ගේ ජාතික මට්ටමේ දේශපාලන නායකයන් සියලු ශ්‍රී ලාංකිකයන්ට සාමකාමී ජීවිතයක් උදාකර දීමට අවංකව කැප නොවන බවයි. සිත්ගන්නා කරුණ නම්, මෙම දෘෂ්ටිකෝණය විවිධ ප්‍රදේශවලින් සහ ස්ත්‍රීන් සහ පුරුෂයන්ගෙන් සහ සෑම වයස් කාණ්ඩයකම පුද්ගලයින් අතර සමානව දක්නට ලැබීමයි. (ප්‍රස්තාර 17, 18 සහ 19 බලන්න)


ප්‍රස්තාරය 17: සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා සාමකාමී ජීවිතයක් ළඟාකර දීමට අපගේ ජාතික මට්ටමේ දේශපාලන නායකයින් කොතරම්දුරට අවංකවම කටයුතු කරනවාදැයි ඔබ සිතනවාද? - ජාතික



**ප්‍රස්තාරය 18:** සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා සාමකාමී ජීවිතයක් ළඟාකර දීමට අපගේ ජාතික මට්ටමේ දේශපාලන නායකයින් කොතරම්දුරට අවංකවම කටයුතු කරනවාදැයි ඔබ සිතනවාද?
- ජනවාර්ගික





**ප්‍රස්තාරය 19:** සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා සාමකාමී ජීවිතයක් ළඟාකර දීමට අපගේ ජාතික මට්ටමේ දේශපාලන නායකයින් කොතරම්දුරට අවංකවම කටයුතු කරනවාදැයි ඔබ සිතනවාද?
- වයස, ප්‍රදේශය සහ ස්ත්‍රී පුරුෂභාවය



## ආගමික නායකත්වය පිළිබඳ අදහස

දේශපාලන නායකයන් හා සසඳන විට ශ්‍රී ලංකාව තුළ සාමය ඇති කිරීම සඳහා ආගමික නායකයින්ගේ කැපවීම කෙරෙහි ධනාත්මක ඇගයීමක් ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලාංකිකයින්ගෙන් 58% ක් පමණ සියලු ශ්‍රී ලාංකිකයින්ට සාමකාමී ජීවිතයක් ළඟා කර දීමට ආගමික නායකයින් කැපවී කටයුතු කරන බව ප්‍රකාශ කරන අතරම 36% ක් එම මතය ප්‍රතික්ෂේප කරති. විශේෂයෙන්ම සුළුතර ආගමික කණ්ඩායම් විශ්වාස කරන්නේ ජාතික මට්ටමේ ආගමික නායකයන් සියලු ශ්‍රී ලාංකිකයන්ට සාමකාමී ජීවිතයක් උදාකර දීමට කටයුතු නොකරන බවයි. වැඩිහිටි පුද්ගලයෙකු ලෙස යුද්ධයෙහි අත්දැකීම් ඇති (දැනට වයස අවුරුදු 46 සහ ඊට වැඩි) පුද්ගලයින් අතර මෙම මතය දැඩි ලෙස දක්නට හැකිය. (ප්‍රස්තාර 20, 21 සහ වගු අංක 07 බලන්න)

**ප්‍රස්තාරය 20:** සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා සාමකාමී ජීවිතයක් ළඟාකර දීමට අපගේ ජාතික මට්ටමේ ආගමික නායකයින් කොතරම්දුරට අවංකවම කටයුතු කරනවාදැයි ඔබ සිතනවාද? -ජාතික





වගුව 07: සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා සාමකාමී ජීවිතයක් ළඟාකර දීමට අපගේ ජාතික මට්ටමේ ආගමික නායකයින් කොතරම්දුරට අවංකවම කටයුතු කරනවාදැයි ඔබ සිතනවාද? - ආගම

| | බුද්ධාගම | හින්දු | ඉස්ලාම් | රෝමානු කතෝලික | රෝමානු කතෝලික නොවන |
|---|---|---|---|---|---|
| බොහෝදුරට | 16.9% | 5.9% | 12.5% | 4.7% | 18.2% |
| තරමක් දුරට | 44.6% | 32.8% | 33.6% | 74.4% | 18.2% |
| කිසිසේත්ම නැත | 35.4% | 44.6% | 37.5% | 18.6% | 63.6% |
| නොදනී | 3.1% | 16.7% | 16.4% | 2.3% | 0.0% |
| ප්‍රතිචාරකයින් සංඛ්‍යාව | 1004 | 186 | 128 | 43 | 11* |

*ප්‍රතිචාරකයින් සංඛ්‍යාව ඉතා කුඩා ප්‍රමාණයකි

ප්‍රස්තාරය 21: සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා සාමකාමී ජීවිතයක් ළඟාකර දීමට අපගේ ජාතික මට්ටමේ ආගමික නායකයින් කොතරම්දුරට අවංකවම කටයුතු කරනවාදැයි ඔබ සිතනවාද?
- වයස, ප්‍රදේශය සහ ස්ත්‍රී පුරුෂභාවය



සෝෂල් ඉන්ඩිකේටර් යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි (CPA) සමීක්ෂණ පර්යේෂණ ඒකකය වන අතර එය වර්ෂ 1999 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කෙරුණි. එමගින් සමාජ හා දේශපාලන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථිර, වෘත්තීය සහ ස්වාධීන සමීක්ෂණ මධ්‍යස්ථානයක් සඳහා දීර්ඝ කාලීනව පැවැති රික්තකයක් පුරවා ඇත. මත විමසීම් හරහා අදහස් ප්‍රකාශ කිරීම ප්‍රජාතන්ත්‍රවාදය සවිබල ගැන්වීමේ මෙවලමක්ය යන දැඩි විශ්වාසයෙන් යුක්තව සෝෂල් ඉන්ඩිකේටර් ආරම්භයේ සිටම සමාජ-ආර්ථික හා දේශපාලන ගැටළු රාශියක් පිළිබඳව මත විමසීම් පවත්වනු ලබයි.


ලිපිනය: නො. 6/1 B, 1/1, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5.
දුරකථන: +94 (11) 2584050
වෙබ්: www.cpalanka.org.survey-research


Marking Social Research Count

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයක් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.


ලිපිනය: නො. 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5.
දුරකථන: +94(11)2081384-6
වෙබ්: http://www.cpalanka.org


CPA
Centre for Policy Alternatives

25 YEARS 1996 - 2021
CENTRE FOR POLICY ALTERNATIVES